# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
### (HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation — 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax — 011-2591125
ලිපිනය / முகவரி / Address — 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07. / 230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை / 230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General) — 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address — ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site — www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. — HYG/W/103
ඔබේ අංකය / உமது இல / Your No. —
දිනය / திக / Date — 2020.05.19

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය**
**කළු ගඟ ද්‍රෝණිය සඳහා වූ නිවේදන - අංක 01**
**දිනය :- 2020/05/19 වේලාව :- පෙ.ව. 9.00**

**වර්ණය - ඇම්බර්**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන වර්ෂාමාන වල දත්ත අනුව පසුගිය පැය කිහිපය තුළ කළු ගඟ ද්‍රෝණියේ ඉහළ ප්‍රදේශ වලට සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබී ඇත. එසේම කළු ගඟ ද්‍රෝණියේ පහළ ප්‍රදේශයටද සැලකිය යුතු වර්ෂාපතනයක් පසුගිය පැය කිහිපය තුළ ලැබී ඇත. මේ හේතුවෙන් කළු ගඟ සහ අතු ගංගා වල ජල මට්ටම සැළකිය යුතු ලෙස ඉහළ නගිමින් පවතින අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන කළු ගංගාවෙහි ප්‍රධාන ජල මිණුම් ස්ථාන වල ජල මට්ටම් සංසන්දනාත්මක ලෙස පහත වගුව තුළ දක්වා ඇත.

| | ජල මිනුම් ස්ථානය | සුළු ගංවතුර මට්ටම | මහ ගංවතුර මට්ටම | 2020/05/19 දින පෙ.ව. 9.00 ට පවතින ජල මට්ටම |
|---|---|---|---|---|
| 01 | මුවගම, රත්නපුර | 7.50 m | 9.50 m | 6.05 m |
| 02 | ඇල්ලගාව | 10.70 m | 12.20 m | 8.38 m |
| 03 | මිල්ලකන්ද (කුඩා ගඟ අතු ගංගාව) | 6.50 m | 8.00 m | 3.77 m |
| 04 | පුටුපාවුල | 4.00 m | 5.00 m | 1.44 m |

ඉහත දත්ත අනුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා අංශයේ ගණනය කිරීම් අනුව ඉදිරි පැය කිහිපය තුළ කළු ගඟ ද්‍රෝණියේ පහත දැක්වෙන ප්‍රදේශ වල සුළු ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බව ද, එසේම වැසි තත්ත්වය තවදුරටත් වර්ධනය වුවහොත් මෙම සුළු ගංවතුර තත්ත්වය මහ ගංවතුර තත්ත්වයක් දක්වා වර්ධනය විය හැකි බවට ද අනතුරු අඟවනු ලැබේ. ඒ අනුව පහත ප්‍රදේශ වල ජනතාවට ඉතා කල්පනාකාරීව කටයුතු කරන ලෙසත්, අදාළ අංශ වලින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

| | |
|---|---|
| **සුළු ගංවතුර තර්ජනයට ලක්විය හැකි ප්‍රදේශ** | රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, කුරුවිට, අයගම, කිරිඇල්ල, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කළු ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශ |

ඉංජි. එස්.පී.සී. සුගීශ්වර
වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)